කොටස් වෙළෙඳ පොළ දැනුමෙන් ආයෝජනයට

කොටස් වෙළෙඳ පොළ ආයෝජනයේදී ඔබ මේ පිළිබඳවත් සැලකිලිමත් වූවාද?

214 වැනි කොටස

INVEST

කොටස් වෙළෙඳ පොළ ආයෝජනයේදී ඔබ සැලකිලිමත් විය යුතු කරුණු යටතේ, 'කොටස් තැරැව්කාර ආයතනයක සේවය කරන්නෙකුට කොටස් ගනුදෙනු කළ හැක්කේ ඔහු හෝ ඇය සේවය කරන ආයතනයෙන් පමණි', 'ආයෝජකයාගේ මූල්‍ය තත්ත්වය, පළපුරුද්ද සහ ආයෝජන අරමුණු පිළිබඳව ආයෝජන උපදේශකයා හොඳින් තේරුම්ගත යුතුය, ඔබ කොටස් තැරැව්කාර ආයතනයකින්ම කොටස් ගිණුමක් ආරම්භ කරගත යුතුය', 'වෙළෙඳ පොළෙහි ඇති අවදානම පිළිබඳව කොටස් තැරැව්කාර ආයතනය ඔබව නිසි ලෙස දැනුම්වත් කර තිබිය යුතුය', 'කොටස් තැරැව්කාර ආයතනය නිවැරදි සහ අංග සම්පූර්ණ වාර්තා තබා ගැනීමක්ද කළ යුතුය', 'ආයෝජකයෙක් සිදුකළ කොටස් ගනුදෙනුවකට අදාළ විස්තර පත්‍රිකාවක් ගනුදෙනු දිනය අවසානයේදී ආයෝජකයා වෙත ලබාදිය යුතුය', 'ආයෝජකයාගේ තොරතුරු පිළිබඳ රහසිගතභාවය කොටස් තැරැව්කාර ආයතනය ආරක්ෂා කළ යුතුය', 'ගනුදෙනු දින සිට ඉදිරි දින 3ක් ඇතුළත (T+3) ආයෝජකයෙක් කොටස් ගනුදෙනු සඳහා අදාළ බේරුම්කරණය සිදුකළ යුතුය', 'කොටස් තැරැව්කාර ශාස්තුවක් හෙව්මට සිදුවේ, කොටස් ගනුදෙනුවකදී යම් වරදක් සිදුවූ විට', 'ආයෝජකයෙකු ලබාදෙන ඇණවුම් පිළිබඳ වාර්තා කොටස් තැරැව්කාර සමාගම පවත්වාගෙන යා යුතුය', 'ආයෝජකයාට සුහදශීලී සේවාවක් ලබාදිය යුතුය' යන මාතෘකා පිළිබඳව සාකච්ඡා කළෙමු. මෙවර ලිපියෙන්ද එවැනි ඔබට වැදගත් වූ මාතෘකා කිහිපයක් පිළිබඳව කතා කිරීමට අපි අදහස් කරන්නෙමු.

ආයෝජකයෙක් ලබාදෙන ඇණවුම් පිළිබඳ තෙවැනි පාර්ශ්වයක් වෙත තොරතුරු ලබාදීම නොකළ යුතුය

කොටස් තැරැව්කාර ආයතනයක් හෝ එහි සේවකයන් ගනුදෙනුකරුවන් සමඟ කටයුතු කිරීමේදී ආයෝජකයෙක් විසින් කොටස් මිලදී ගැනීමක් හෝ කොටස් විකිණීමක් සම්බන්ධයෙන් ලබාදෙන ඇණවුම් පිළිබඳ විස්තර තවත් පාර්ශ්වයක් වෙත හෙළිදරව් කිරීම නොකළ යුතුය. කොටස් තැරැව්කාර ආයතනයක් සෑමවිටම අවංකභාවය ආරක්ෂා කෙරෙන ආකාරයෙන් කටයුතු කිරීම අවශ්‍ය වෙයි. කෙසේ වෙතත්, ආයෝජකයාගේ ලිඛිත අවසරය මත හෝ යම්කිසි නීතිමය තත්ත්වයක් යටතේ තොරතුරු හෙළිදරව් කළ යුතු අවස්ථාවක එවැනි තොරතුරු ලබාදීමක් කිරීමට හැකියාව ඇත.

කොටස් තැරැව්කාර ආයතනයක් හෝ ආයෝජන උපදේශකයෙක් විසින් ලබාදෙන ඇණවුමක් ඉදිරිපත් කිරීම ආයෝජකයාගේ උපදෙස්වලට අනුව සිදුකළ යුතුය

ඉන් අදහස් වන්නේ කොටස් ගනුදෙනුවක් සම්බන්ධ අවසාන තීරණය ආයෝජකයා විසින් ගත යුතුය යන්නයි. එනම්, ආයෝජන උපදේශකවරයෙකුගේ ප්‍රධාන භූමිකාව වන්නේ ආයෝජකයා ලබාදෙන ඇණවුම් ඒ ආකාරයෙන් පරිගණක පද්ධතිය වෙත ඇතුළත් කිරීම පමණි. ආයෝජන උපදේශකවරයා ආයෝජන තීරණ ගැනීමක් සිදු නොකරයි. කෙසේ වෙතත්, ආයෝජකයෙක් තමන් වෙනුවෙන් ගනුදෙනු කිරීමේ අයිතිය එනම් තීරණ ගැනීමේ අයිතිය ලබාදී ඇති අවස්ථාවක ආයෝජන උපදේශකයෙකුට තමන්ගේ තීරණ අනුව ආයෝජකයා වෙනුවෙන් කටයුතු කළ හැකිය. එය විශේෂ අවස්ථාවක් වන අතර එසේ සිදු කරනුයේ අභිමතය පරිදි ගනුදෙනු කිරීමේ ගිණුම (Discretionary Account) නමින් ගිනුමක් ආරම්භ කිරීමෙනි. එහිදී ආයෝජකයා තමන් වෙනුවෙන් ආයෝජන තීරණ ගෙන ගනුදෙනු කිරීමට ලිඛිත අවසරය ලබාදෙනු ඇත.

නීත්‍යානුකූල නොවන ගනුදෙනු හැසිරීම

ආයෝජකයාගේ අනුදැනුමක් නොමැතිව කොටස් මිලදී ගැනීමක් හෝ විකිණීමක් සඳහා ඇණවුම් ඇතුළත් කිරීම, ආයෝජකයාගේ උපදෙස්වලට බාහිරව ගනුදෙනු ඇතුළත් කිරීම, ආයෝජකයාගේ ගිණුම තුළින් තෙවැනි පාර්ශවයක් සඳහා ගනුදෙනු කිරීම ආදිය සිදුකළ නොහැකි ගනුදෙනු ක්‍රියාකාරකම්ය.

ව්‍යාප හෝ නොමග යවනසුලු වෙළෙඳපොළක් ඇති කිරීම

නිදහස් හා සාධාරණ වෙළෙඳ පොළක් පවත්වාගෙන යාමට බාධා පැමිණවීමක් ඉහත කී කෘත්‍රිම ආකාරයේ වෙළෙඳ පොළක් ඇති කිරීමෙන් සිදුවෙයි. ලැයිස්තුගත සුරුකුම්පත්වල මිල ගණන් ආයෝජකයන් නොමග යවන ස්වභාවයක් එමගින් ඇති වෙයි. එය වැරදි සහගත වෙළෙඳපොළ හැසිරීමකි.

අධික ලෙස සිදු කරන ගනුදෙනු

කොටස් තැරැව්කාර ආයතනය හෝ එහි සේවකයන් වෙත ඉහළ කොමිස් මුදල් ලබාගැනීමේ චේතනාව ඇතුව ආයෝජකයන්ගේ ගිණුම් මත අධික ලෙස කොටස් මිලදී ගැනීම හෝ විකිණීමද අසාමාන්‍ය වෙළෙඳපොළ හැසිරීමකි.

අභ්‍යන්තර තැනැත්තන් විසින් සිදුකරන ගනුදෙනු

රහස්‍ය තොරතුරු පදනම් කරගනිමින් තමන්ගේ සුභසිද්ධිය සඳහා පමණක් ගනුදෙනු කිරීමද අසාමාන්‍ය ගනුදෙනු හැසිරීමකි. එය තවත් විස්තර කළ හොත් ප්‍රසිද්ධ නොකළ මිල සංවේදී තොරතුරු ළඟ තබාගෙන ගනුදෙනු කළ නොහැකිය.

පෙර විකුණුම්

පෙර විකුණුම් යනුවෙන් හඳුන්වන්නේද වෙළෙඳ පොළ සිදුවන නීත්‍යනුකූල නොවන ගනුදෙනු හැසිරීම් ක්‍රමයකි. එනම් ආයෝජකයන් විසින් පද්ධතිය තුළට ඇතුළත් කර ඇති ඉදිරියේදී සිදුවීමට යන කොටස් ගනුදෙනුවක් පිළිබඳව තොරතුරු තමා සන්තකයේ තබාගෙන ලාභගැනීමේ පරමාර්ථයෙන් ගනුදෙනුවල නිරතවීමකි.

කොටස් තැරැව්කාර ආයතනයක නියෝජිත ආයතනයක් පවත්වාගෙන යා හැකිය

ඕනෑම කොටස් තැරැව්කාර ආයතනයකට නියෝජිතායතනයක් පවත්වාගෙන යාමට හැකියාව ඇත. විශේෂයෙන්ම තම ආයතනය වෙත නව ගනුදෙනුකරුවන් සම්බන්ධ කරවීම එම නියෝජිතායතනවල මූලිකම කාර්යයි. එහෙත් ආයෝජන උපදෙස් ලබාදීම එම ආයතනවලට කළ නොහැකිය. නවක ගනුදෙනුකරුවන් කොටස් තැරැව්කාර ආයතනය වෙත හඳුන්වාදීම පමණක් කළ හැකිය. ආයෝජන උපදෙස් ලබාදිය හැක්කේ කොටස් තැරැව්කාර සමාගම්වලට පමණි. මෙම කොටස් තැරැව්කාර ආයතනයක් සහ එහි නියෝජිත ආයතන අතර වෙනස ආයෝජකයකු විසින් හොඳින් වටහා ගැනීම අවශ්‍ය වේ.

කොටස් තැරැව්කාර ආයතනයකට තම ගනුදෙනුකරුවන් සඳහා ණය පහසුකම් ලබාදීමට හැකියාව ඇත

එසේ ණය පහසුකම් ලබාදෙන්නේ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගම්වල කොටස් මිලදී ගැනීම සඳහා වේ. යම් කොටස් තැරැව්කාර ආයතනයකට ගළපනලද ශුද්ධ ප්‍රාග්ධනය මෙන් තුන් ගුණයක ණය ආයෝජකයන් වෙත ලබාදීමට අදාළ නීතිරීති අනුව ඉඩ සලසා ඇත. මෙසේ ණය පහසුකම් සැපයීමේදී ආයෝජකයා සතු කොටස් ඇපයට තැබීම අවශ්‍ය වේ. එමෙන්ම එම ණය සැපයීමේදී ආයෝජකයා සතු කොටස්වල වෙළෙඳ පොළ වටිනාකමින් 50% ඉක්මවා නොයන ලෙස ලබාදිය යුතුය.

ණය මත කොටස් මිලදී ගෙන ඇත්නම් කොටස් තැරැව්කාර ආයතනයට බලෙන් වුවද කොටස් විකිණීමට හැකියාව ඇත

ආයෝජකයා ණය මත මිලදී ගෙන ඇති කොටස්වල වෙළෙඳ පොළ වටිනාකම 25% න් පහළ වැටුණහොත් ඊළඟ වෙළෙඳ පොළ දිනයේදී ඔහු විසින් හිඟව පවතින ප්‍රමාණය සම්පූර්ණ කළ යුතුය. එසේ ආයෝජකයා එම හිඟය පිරවීමට අපොහොසත් වුවහොත් ආයෝජකයා මිලදී ගෙන ඇති කොටස් විකුණා දැමීමට තැරැව්කාර ආයතනයට හැකියාව ඇත.

විශේෂ ස්තූතිය - තුෂාර ජයරත්න මහතා, අධ්‍යක්ෂ, ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යයන හා බාහිර සම්බන්ධතා, ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව.